(44)

UNIVERSITY OF COLOMBO, SRI LANKA
29 NOV 1984
LIBRARY

# කම්කරු ළමයින් ගේ භාෂා කුසලතා

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති
උපාධිය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය

UCLIB
391101

PERMANENT
REFERENCE
NOT TO BE
REMOVED

කර්තෘ

තල්පාවිල කන්කානම්ගේ කමලා අමරවීර (සාමාන්‍ය ශාස්ත්‍රවේදී)
අධ්‍යාපන ඩිප්ලෝමා ( සම්මාන)

M. Phil' 55

1983 දෙසැම්බර්

391101

UNIVERSITY OF COLOMBO
LIBRARY

සංක්ෂේපයෙන් ..........

## පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ දළ ජාතික නිශ්පාදනයෙන් 4% ක් පමණ අධ්‍යාපනය සඳහා වැය කෙරේ. 1943 සිට කන්නංගර වාර්තා අනුව නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වේ. එසේම 1979 සිට ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින සියලුම ළමයින්හට නොමිලයේ පොත් සැපයීම ද කෙරේ. එහෙත් අධ්‍යාපනය සඳහා වැය කරන මේ මානව හා භෞතික සම්පත් වලින් නියම ප්‍රයෝජන ගන්නේ සීමිත කොටසකි. අධ්‍යාපනය සඳහා වැය කරන සම්පත්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ තවමත් ලැබෙන බවක් නොපෙනේ. එයට හේතු රාශියකි. පාසල්හිදී ළමයින් දැනුම ලබාගන්නා ප්‍රධාන උපකරණය වන්නේ භාෂාවයි. ළමයින් ගේ භාෂා කුසලතා ඔවුන් අධ්‍යාපනයෙන් කෙබඳු ඵල ලබයිද යන්න කෙරෙහි තීරණාත්මකව බලපායි.

ලෝකයේ නොයෙක් රටවල මේ පිළිබඳ ව විවිධ අංශයන් ගෙන් පර්යේෂණ කර ඇත. ශ්‍රී ලංකාවේ ද මෙම ක්ෂෙත්‍රයට අදාල පර්යේෂණයන් කීපයක්ම සිදු කෙරී ඇත. අධ්‍යාපන පහසුකම් බොහෝ සේ එක හා සමානව බෙදී යාමට කටයුතු සලස්වා ඇති නමුත්, ශ්‍රී ලංකාවේ විභාග ප්‍රතිඵල දෙස බලනවිට පෙනියන සාමාන්‍ය කරුණක් වන්නේ, පහළ සමාජ ස්ථරයන්හි ළමයින් ගේ සාධනය දුර්වල බවයි. ළමයින්ගේ භාෂා කුසලතා ඉහත කී කරුණු හා බැඳී පවතිතැයි යන කල්පිතය මත, ළමා භාෂා කුසලතා කෙරෙහි බලපාන සාධක විග්‍රහයට ලක්කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

## පර්යේෂණයේ අරමුණු

X තෝරා ගත් නියැදියේ (විවිධ සමාජ පන්තිවලට අයත් ළමයින්) ළමයින් ගේ භාෂා කුසලතා මැනීම.

X ළමයින් ගේ භාෂා කුසලතා කෙරෙහි සමාජ ආර්ථික පරිසරය බලපාන ආකාරය විමසීම.

X නිවසේ බුද්ධිමය වාතාවරණය හා ළමයින් ගේ භාෂා කුසලතා අතර

ඇති සම්බන්ධය විමසීම.

X පාසල අවට පරිසරය හා ළමයින් ගේ භාෂා කුසලතා අතර සම්බන්ධය සෙවීම.

X අධ්‍යාපනය සඳහා වැය කෙරෙන සම්පත් නිසි ආකාර සෑම පාසලකටම නොබෙදී යාම සහ ළමයින් ගේ භාෂා කුසලතා අතර සම්බන්ධය සෙවීම.

X කනිෂ්ඨ ද්විතීයක සිංහල විෂය+මාලාව (විශේෂයෙන්ම 7 වැනි ශ්‍රේණියේ) ළමයින් ගේ විවිධ අවශ්‍යතා ගැන සැලකිල්ලක් කර තිබේදැයි විමසීම.

<u>දත්ත ලබා ගන්නා ක්‍රම හා දත්ත විශ්ලේෂණය</u>

කො/මාලිගාවත්ත මහා විද්‍යාලය, කො/මහානාම මහා විද්‍යාලය සහ කො/විද්‍යාවර්ධන මහා විද්‍යාලය යන විද්‍යාල තුනේ 7 වැනි ශ්‍රේණියේ ඉගෙන ගන්නා ළමයින් 130 ක් හා එම ළමයින්ගේ පවුල් නියැදිය ලෙස ගෙන සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ක්‍රමය, සංඛ්‍යා ලේඛන, සාධන පරීක්ෂණ හා බුද්ධි පරීක්ෂණ ඇසුරු කරගෙන දත්ත ලබා ගැනීම කෙරේ. දත්ත විශ්ලේෂණයේ දී පොදුවේ සියලුම පරීක්ෂණ සඳහා ප්‍රතිශත භාවිතා කරන අතර කියවීමේ පරීක්ෂණය සඳහා 't' පරීක්ෂණය භාවිතා කරනු ලැබේ.

<u>ප්‍රධාන සොයා ගැනීම්</u>

X විවිධ සමාජ පන්තිවලට අයත් ළමයින් ගේ භාෂා කුසලතා අතර ඇත්තේ ඍණ සම්බන්ධයකි.

X සමාජ ආර්ථික පරිසරය අනුව ළමයින් ගේ භාෂා කුසලතා වෙනස් වේ.

X නිවසේ බුද්ධිමය වාතාවරණය හා ළමයින් ගේ භාෂා කුසලතා අතර ඇත්තේ ධන සම්බන්ධතාවයකි.

X පාසල අවට පරිසරය හා ළමයින් ගේ භාෂා කුසලතා අතර ධන සම්බන්ධයක් ඇත.

X අධ්‍යාපනය සඳහා වැය කෙරෙන සම්පත් සහ ළමයින් ගේ භාෂා කුසලතා අතර ධන සම්බන්ධයක් ඇත.

X කනිෂ්ඨ ද්විතීයක සිංහල විෂය+මාලාව ළමයින් ගේ විවිධ අවශ්‍යතා අනුව සකසා නැත.